قیامت کا امتحان

# කියාමත් (විනිශ්චය) දිනයේ පරීක්ෂණය

## THE TEST OF THE JUDGEMENT DAY


අමීරේ අහ්ලුස්සුන්නත්, අබූ බිලාල් හස්රත් අල්ලාමා මෞලානා
මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරි, රzසවි)
(دامت برکاتہم العالیہ)
තුමාණන් විසින් උර්දු භාෂාවෙන් කළ දේශනයේ සිංහල පරිවර්තනය



**ෆයිසානේ මදීනා**

නො. 10, මැසන්ජර් වීදිය, කොළඹ - 12
දුරකථනය : (011) 2394748/9
Email : maktaba@dawateislami.net
Website : www.dawateislami.net

مکتبۃ المدینہ

# Keep Watching Madani Channel

شاهدوا القناة المدنية مدنی چینل دیکھتے رہیے

Dawat-e-Islami, an international non-political propagational movement of Qur'an and Sunnah. Please, attend Dawat-e-Islami's weekly Ijtima held in your city. In Karachi, the weekly Ijtima is held every Thursday after Salaatul-Maghrib at Faizan-e-Madina, Mahallah Saudagran, Old Sabzi Mandi, Baab-ul-Madina Karachi, Pakistan. It is also a Madani request to spend the whole night in the Ijtima.

## Details of Frequencies for Madani Channel

| S.no | Satellite | Beam Type | Position | Dowlink | Frequency | Transmission | Polarity | Symb Rate | FEC |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Asiasat 3s | Global | 105.5 E | C- Band | 3739 | Digital | Vertical | 2815 | 3/4 |
| 2 | Intelsat 10 | Africa & Europe Beam | 68.5 E | KU Band & DTH | 12682 | Digital | Horizontal | 27757 | 1/2 |
| 3 | Atlantic Bird 4A | Middle East | 7.2W | KU Band | 10992 | Digital | Vertical | 27500 | 3/4 |
| 4 | Eurobird1 | Europe | 28.5 E | Sky Platform | 12523 | Digital | Horizonta | 27500 | 2/3 |

www.dawateislami.net

# කියාමත් (විනිශ්චය) දිනයේ පරීක්ෂණය

## (Kiyamath ka imthihan)

අමීරේ අහ්ලුස්සුන්නත්, අබු බිලාල් හස්රත් අල්ලාමා මෞලානා
මුහම්මද් ඉල්යාස් අත්තාර් (කාදිරි, රzසවි)
(دامت برکاتهم العالیه)
තුමාණන් විසින් උර්දු භාෂාවෙන් කළ දේශනයේ සිංහල පරිවර්තනය

**ෆයිසානේ මදීනා**

නො. 10, මැසන්ජර් වීදිය, කොළඹ - 12
දුරකථනය : (011) 2394748/9

**Email : maktaba@dawateislami.net**
**Website : www.dawateislami.net**

# පටුන

1. කියාමත් දිනයේ විභාගය (පරීක්ෂණ) ........................................ 3
2. සලවාතයේ මහිමය........................................................................... 3
3. මදනි දරුවාගේ භය (භීතිය)............................................................. 3
4. මදනි වැටුප් (පඩියන්) 3ක් .............................................................. 4
5. විනිශ්චය දිනයේ ප්‍රශ්ණ 5ක් ............................................................. 7
6. විභාගය හිස මතය ............................................................................ 7
7. මුස්ලිම්වරුන් සමඟ කුමන්ත්‍රණය..................................................... 8
8. ලක්ෂයක තෑග්ගක් ........................................................................... 9
9. පියාගේ ජනාසාව (දේහය) ...............................................................10
10. අභාග්‍යවන්ත දේහය (මිනිය)............................................................10
11. ආගමින් ඈත් කරවමින් සිටිති ........................................................ 11
12. මුස්ලිම්වරුන්ට මුස්ලිම්වරුන් විධියට සිටීමට
ඉඩ දුන්නේ කවදාද? ......................................................................12
13. ෂෛතාන්ගේ කුමන්ත්‍රණය...............................................................13
14. පාපයන්ට ආම්පන්න (කාරණය) ....................................................14
15. T.V හඳුන්වා දෙනු ලැබුවේ කවදාද?.................................................14
16. නිරයේ පැනීමට තර්ජන .................................................................15
17. මෝඩ කථිකාචාර්යවරයා ................................................................16
18. තම ආත්මයට (සිත) හා ෂෛතාන්ට විරුද්ධව ජිහාද්........................17
19. පියාගේ අවසන් යුතුකම් .................................................................17
20. මයියතය (මරණය)ට අඬා වැලපීමේ අzසාබ් (වේදනාව) ...............18
21. ජනාසාවට උර දෙන ක්‍රමය.............................................................18
22. ජනාසාවකට උර දීමේ මහිමය .......................................................19
23. කබ්රයේ ආලෝකය ගැන නොසිතා සිටීම ........................................19
24. නීරෝගීකම මිළදී ගත නොහැක ...................................................... 20
25. ධනවතුන් හා රෝගාබාධයන් ..........................................................21
26. කාfපිර් වරුන්ගේ කරදර හා (අඩත්තේට්ටම්) පීඩා මැද හිංසා .......21
27. කබ්රයේ (සොහොනේ) ප්‍රශ්ණ හා පිළිතුර .........................................22
28. කබ්රයේ ප්‍රශ්ණවලට පිළිතුරු දීමට නොහැකි වීමට හේතු.............. 24
29. තව්බා කර ගන්න ........................................................................... 26
30. අපි ටිකින් ටික කුඩා වන්නෙමු ........................................................ 27
31. ලෞකික විභාගයට ඇති විශේෂත්වය............................................... 28
32. නවීද් අත්කාරීට කරුණාව............................................................... 30
33. මෙය අලුත් සිදු වීමක් නොවේ .........................................................31

اَلْحَمْدُ لِلّٰهِ رَبِّ الْعٰلَمِيْنَ وَالصَّلٰوةُ وَالسَّلَامُ عَلٰى سَيِّدِ الْمُرْسَلِيْنَ
اَمَّا بَعْدُ فَاَعُوْذُ بِاللّٰهِ مِنَ الشَّيْطٰنِ الرَّجِيْمِ ؕ بِسْمِ اللّٰهِ الرَّحْمٰنِ الرَّحِيْمِ ؕ

# කියාමත් දිනයේ විභාගය (පරීක්ෂණ)

ෂෛතාන් කොතරම් උත්සාහ කර මෙම පොත් පිංච කියවීම වැළැක්වීමට උත්සාහ කළත් ඔබ මෙය සම්පූර්ණයෙන් කියවන්න. ඔබට ඔබේ සිත තුළ විශාල විප්ලවයක් සිදුවන බව තේරුම් ගත හැකිය.

# සලවාතයේ මහිමය

හZස්රත් සෛයිදුනා අබුදර්දා رضی اللہ تعالٰی عنہ මෙසේ රිවායත් කරති. ෂfපීඋල් මුZස්නිබීන් රහ්මතුල් ලිල් ආලමීන් صلی اللہ تعالٰی علیہ واٰلہٖ وسلم තුමාණන්ගේ රුවන් වැකියක් නම්, කෙනෙක් උදේ සවස දහ (10,10) වතාවක් සලවාතය උසුරන්නේ ද කියාමත් දිනයේ ඔහුට මාගේ ෂfපාඅතය හිමිවන්නේය.

(මජ්මඋස්Zසවාඉද් 17022 වැනි හදිසය. 10 වැනි කොටස 163 වැනි පිටුව දාරුල් fපිකර් බේරුත්)

صَلُّوا عَلَى الْحَبِيب ! صَلَّى اللّٰهُ تَعَالٰى عَلٰى مُحَمَّد

# මදනි දරුවාගේ භය (භීතිය)

මැදියම රැයේ එකවරම පුංචි දරුවා නැගී සිට ඉකිබිඳ අඬන්නට විය. එය දැක දරුවාගේ පියා බයවී දරුවා වෙත පැමිණ ඇයි අඬන්නේ මගේ පැටියෝ? පියා විමසීය. හෙට බ්‍රහස්පතින්දා, ගුරුතුමාණන් මුළු සතියේ ම පාඩමෙන්

පරීක්ෂණ කරනවා. මම පාඩමට උනන්දුවක් දැක් වූයේ නැහැ. ගුරුතුමාණන් ගහයි යැයි අඬමින් කියා සිටියේය. මෙසේ කියමින් ඉකි ගසන විට පියාගේ ඇස් වලට කඳුළු ආවේය. ඔහු තම නfප්ස් (ආත්මය) දෙස බලා තමන්ට මෙසේ මුමුණන්නට විය. මේ දරුවාට නම් සතියක ප්‍රශ්ණ වලට පිළිතුරු දීම පමණයි තිබෙන්නේ. තවද ගුරුතුමාට කුමක් හෝ කියා කර ගන්නත් පුළුවන්. නමුත් මෙයා ගහයි කියා බයට අඬයි. නිදාගන්නෙත් නැහැ. ආහ්! ආහ්! ආහ්! මට මුළු ජීවිත කාලයේ ප්‍රශ්ණවලට එම වාහිද් කහ්හාර්ට عَزَّوَجَلَّ උත්තර දීමට සිදුවෙයි. එසේම ඔහුට අල්ලස් දීමට නොහැක. මට උනන්දුවෙන් කියාමත් දිනයේ විභාගයට මුහුණ දීමට සිදු වී ඇත. නමුත් මම නිදා සිටිමි. මට භයක් නොදැනෙන්නේ ඇයි? (දුර්රතුන්නාසිහීන් 295 වැනි පිටුව මක්තබා හක්කානියියා පිෂ්වර්)

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! එම සිදුවීමෙන් (සිද්ධියෙන්) අපහට ගැනීමට ගොඩක් මදනි පුල් (මදනි ආදර්ශයන්) ඇත. ඔබත් කල්පනා කරන්න. මාත් සිතන්නම්, පුංචි දරුවෙකුගේ හා ඔහුගේ පියාගේ මදනි සිතුවිලි ගැනත් සිතන්න. දරුවා මදරසාවේ (පරීක්ෂණය) ගැන අඬන අතර පියා කියාමත් දිනයේ (පරීක්ෂණයේ) භයංකාරත්වය ගැන සිතමින් සිටින්නේය.

## මදනි වැටුප් (පඩියන්) 3ක්

හZසරත් සෛයිදුනා හාතිමේ අසම් علیہ رحمۃ اللہ الاکرم තුමාණන්ට ධනවත් පුද්ගලයෙකු කෑමට ආරාධනාවක් දුන්

විට එතුමාණන් එය නොපිළි ගත්හ. ඔහු නැවත නැවත ආරාධනා කරමින් ඉල්ලීම් කරන විට එතුමාණන්, මෙම කොන්දේසි 3ක් පිලිගන්නවා නම් INSHA ALLAH පැමිණෙමි.

1) මම සිතන තැනක වාඩි වෙමි.

2) සිතන දෙයක් කමි

3) මම පවසන කුමක් හෝ ඔබ කළ යුතුය.

එම ධනවත් පුද්ගලයා ද මෙම කොන්දේසි තුනම එක සිතින් පිළිගත්තේය. වලියුල්ලාන්ව (අල්ලාහ් ත ආලා හට සමීප වූ කෙනෙක්) දැක බලා ගැනීම සඳහා විශාල පිරිසක් පැමිණ සිටියහ. ආහාර පානද ලෑස්ති කර තිබුණි. නියමිත වෙලාවට හZසරත් رحمة الله عليه පැමිණියේය. පැමිණි විගස පාවහන් තබන ස්ථානයේ ඉඳගත්හ. (අසුන් ගත්හ) එයට මොකුත් නොපැවසීය මක් නිසාද යත් තමන් කැමති ස්ථානයක අසුන් ගන්නා බවට එක කොන්දේසියක් වීමයි. ටික වේලාවකින් ආහාර අනුභව කිරීමට ආරම්භ වූ විට සියල්ලෝම කුකුල් මස් ව්‍යංජනය සමඟ දැත් පිසදමන්නට විය. නමුත් වලියුල්ලාහ් පමණක් තම කමිස සාක්කුවට අත දමා වියලුනු රොටි කැබැල්ලක් ගෙන අනුභව කරන්නට (කන්නට) විය. මේ සියල්ල අවසන් වූ පසු එතුමාණන් සත්කාර කරන්නා අමතා මෙසේ පැවසීය. ලිප අරගෙන එන්න. එහි රොටි පුච්චන තැටියක් තබන්නයි අණ කළහ. එසේම කරන ලදි. එය ගින්නෙන් රත් වී රතු පාට ගිනි පුළුඟු වූ විට එතුමාණන් පාවහන් නොමැතිව එහි මත නැගී සිට ගත්හ. ජනතාව ද ඇස් ඇර විශ්මයෙන්

බලා සිටියහ. ඉන්පසු එතුමාණන් මෙසේ පැවස සිටියහ. අද "මම වියළුනු රොටි අනුභව කළෙමි." එසේ පැවසීමෙන් පසු බිමට බැස එම ස්ථානයේ රැස්ව සිටින්නන් අමතා දැන් ඔබ සියල්ල කාපු දේවල්වලට මෙම රත් වූ තැටිය මත නැගීසිට පිළිතුරු දෙන්නැයි පැවසූහ. එකවරම සියල්ලම (බෙරිහන්) කෑගසන්නට විය. සියල්ලෝම එක් වී මෙසේ පවසා සිටියහ. යා සෙයියදී ඔබතුමාණන් අල්ලාහ්තආලාගේ වලීය. තවද මෙය ඔබතුමාණන්ගේ කරාමතයන් (හාස්කමක්) මෙතරම් උණුසුම අපේ සිනිඳු පතුල දරා ගන්නේ කෙසේද? අපි පාපී ලෝකාශාවන්ගෙන් පිරිනු අයයි. එයට එතුමාණන් මෙසේ පවසා සිටියහ. ජනතාවනී! සූර්යයා සැතපුම් 1 1/4ක දුරින් පැමිණි විට කෙසේ විය හැකි දැයි මතක් කර ගන්න. අද සූර්යයා අප වෙතින් සැතපුම් කෝටි ගණනක් දුරින් ඇත. මේ අවස්ථාවේ සූර්යයාගේ පිටු පස අප හට දිස්වෙයි. නමුත් එම වෙලාවේ සූර්යයාගේ ඉදිරි පස අප හට දිස්වෙනු ඇත. එසේ ම තඹ වලින් සෑදුනු පොළොව ගැනත් සිතන්න. මේ රශ්මිය (උණුසුම්) ගැනත් සිතන්න! මෙය නම් ලෝකයේ ගින්නෙන් උණුසුම් වී ඇත. අල්ලාහ්ගේ (දෙවියන්ගේ) නාමයෙන් මෙය එම තඹ වලින් උණුසුම් පොළව හා සන්සන්දනය කර බලන විට මෙය කිසිවක් නොවේ. (මෙය අමාරු කාර්යයක් නොවේ) එම තඹ වලින් සෑදුනු පොළවේ ඔබට නැගී සිටින්නට සිදු වෙයි.

ثُمَّ لَتُسْـَٔلُنَّ يَوْمَئِذٍ عَنِ النَّعِيمِ ٨

**තේරුම කන්සුල් ඊමාන් :-**

"ඉන්පසු අනිවාර්යයෙන්ම එම දිනයේ ලැබූ භාග්‍යයන් ගැනත් ප්‍රශ්ණ කරනු ලැබේ." (අත්තකාසුර්. ජු30. ආයත්8)

දැන් ඔබට මේ ලෝකයේ (රත් වූ තැටිය) මත නැඟී සිට එක් වේලක කෑම ගැන පිළිතුරු දිය නොහැකිව සිටින විට හෙට කියාමත් දිනයේ මොන කරාමතයක් (හාස්කමක්) පෙන්වමින් ද ජීවිතය පුරා භුක්ති විඳපු නිඃමතයට පිළිතුරු දීමට සිටින්නේ යැයි ඇසූහ. මෙම සිත් සසල කරවන දේශනය අසා ජනතාව වැළපෙමින් අඬ අඬා තම පව්වලට තව්බා කරන්නට විය. (තස්කිරතුල් අව්ලියා 1වැනි කොටස 222වැනි පිටුව ඉන්තිෂාරාත් ගුන්ජිනා. ටෙහ්රාන්)

## විනිශ්චය දිනයේ ප්‍රශ්ණ 5ක්

හිතාදර ඉස්ලාමීය සහෝදර වරුණි! අපි කොතරම් සිනාසී කඳුළු සලා ගාණක් නැතුව සිටියත් කියාමත් දිනයේ පරීක්ෂණය සත්‍යයි. තිර්දිරි ෂරීfපයේ මේ ගැන මෙසේ පවසයි. මිනිසා විනිශ්ච දිනයේ ප්‍රශ්ණ 5කට පිළිතුරු දෙන (සපයන) තෙක් සෙලවීමටත් (හෙල්ලීමටත්) නොහැකිය. 1) ඔබ ජීවිත කාළය ගත කලේ කෙසේද? 2) තාරුණ්‍ය ගත කළේ කෙසේද? 3) මුදල් හම්බ කළේ කෙසේද? 4) වියදම් කළේ කොතනද? 5) තමන්ගේ දැනුමට අනුව කොතරම් අමල් කරාද? (ජාමිඋත්තිර්මිදී 2424 හදීසය 4වැනි කොටස 188 පිටුව දාරුල් fපික්ර් බේරුත්)

## විභාගය හිස මතය

දැන් කාලයේ ලෝකයේ සිසුවෙකුට විභාගය ළං වන විට ඔහු දින කීපයකට පෙර ම කළබලයට පත්වෙයි. සෑම විට ඔහුගේ මේ කල්පනාවේ “විභාගය හිස මතය”

කියාය. ඔහු රෑට නිදිමරාගෙන විභාගයට ලෑස්ති වෙයි. අනුමාන ප්‍රශ්ණවලට පිළිතුරු සොයයි. සැක සිතන සියලුම ප්‍රශ්ණවලට පිළිතුරු සොයයි. නමුත් මෙලොවදී විභාග ය ඉතාමත් පහසුයි. ලේසියි. එහි දූෂණයක් කළ හැකිය. අල්ලස් දිය හැක. තවද එසේ සියල්ල කර සමර්ථ වූ පසුත් වැඩි වැඩියෙන් වුණත් සිදුවන්නේ වසරක උසස් වීමක් පමණය. එයින් අසමත් වූ කෙනාව අත්අඩංගුවට ගෙන බන්ධනාගාරයේ දමන්නේ ද නැත. සිදුවන්නේ වසරක් උසස් වීම පමණක් සිදු වන්නේ නැති එක විතරයි බලන්න! මිනිසා මෙම ලෞකික විභාගය සඳහා ලෑස්තිවීමට කොතරම් දුක් විඳිනවාද, නින්ද නොයන බෙහෙත් යනාදිය පාවිච්චි කරමින් නිදිමරා ගෙන විභාගයට මුහුණ දීමට සැරසෙති. ආහ්! කියාමත් දිනයේ විභාගයට (පරීක්ෂණයට) මුස්ලිම්වරු මෙකළ ලෑස්ති නොවන්නා සේය. මෙහි ප්‍රතිඵල නම් සමත් වුවහොත් අවසන් නොවන සැප සම්පත් වලින් පිරුණු ස්වර්ගයයි. අසමත් වුවහොත් සදාකාලයේ ම නිරයේ වේදනා විඳිමින් සිටීමට සිදු වෙයි.

## මුස්ලිම්වරුන් සමඟ කුමන්ත්‍රණය

ආහ්! අද මුස්ලිම්වරුන් සමඟ කුමන්ත්‍රණයක් සිදුවෙමින් පවතියි. ටිකින් ටික මුස්ලිම්වරුන්ගේ සිත් වලින් ඉස්ලාමය ගැන මුහබ්බත් (ආදරය) තුරන් වෙයි. රසූල් صَلَّى اللهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ගේ ගරුත්වයන් සිත් වලින් ඉවත් කරවති, මුස්කෙfපාතුමාණන්ගේ සුන්නතයන් මකා දැමීමට උත්සහ කරති, අපගේ සමාජයේ දැන් සිදුවෙමින් පවතින දේවල් ගැනත් සිතන්න. කණගාටුයි! විවාහ උත්සව වලදීත්

සතුටු අවස්ථා වලදීත් මුස්ලිම්වරු මහපාරේ නටමින් සිටිනවා දැකගත හැක. ශීලාචාරකමක්, ලැජ්ජාශීලිකමත් නැති වී ගොස් ඇත.

## ලක්ෂයක තෑග්ගක්

කෙසේ නමුත් ඉස්ලාමීය විරෝධීන් ගේ මෙම කුමන්ත්‍රණය අද ඊයේ සිට නොව බොහෝ කලකට පෙර සිට ආරම්භ විය. පළමුවෙන් මුස්ලිම්වරුන්ට රසූල් صلى الله تعالى عليه وآله وسلم තුමාණන් ගේ සුන්නතයන් ගෙන් දුරස් කරන්න. ඔවුන් විනෝදකාමී ජීවිතයට පුරුදු කරන්න ඉන් පසු සිතන තරම් මෝඩයාට අන්දවන්න. ඔවුන් පාලනය කරගන්න. මම සිතනවා මේ කාලයේ මුස්ලිම්වරුන්ගෙන් 5%ක් පමණ වූ ප්‍රතිශතයක් සලාතය ඉටු කරනවා ඇත. 95%ක් පමණ මුස්ලිම් වරු සලාතය ඉටු කරන්නෙම නැතිව ඇති. සලාතය ඉටු කරන්නන්ගෙනුත් දාහකට එකක් දෙකක් පමණ නීති රීති සමඟ සලාතය ඉටු කරන්නන් සිටිය හැක. උගතුන්ගෙ රැස්වීමකදී එහි ගුරුවනරුන් වෛද්‍යවරුන්, ඉන්ජිනේරුවරුන්, ඔfපිසර් යනාදීන් උලමාවරුන් හැර ලක්ෂසංඛ්‍යාත මුස්ලිම්වරුන් එක්රැස් වන (ඉජ්තිමා) සමුළුවකදී අන් අයට රුපියල් ලක්ෂයක් පෙන්වා මෙසේ ප්‍රශ්ණයක් අසන්න. සලාතයට අර්කාන් (කුළුණු) කීයද? නියම පිළිතුර දෙන්නාට මෙම ලක්ෂයක මුදල පිරිනමනු ලැබේ යැයි පවසන්න. සමහර විට ඔබේ ලක්ෂයක මුදල ඉතිරි විය හැක. මක්නිසාද යත් ලෞකික සියලුම දැනුම ලබා ගත්තත් සලාතයේ අර්කානය (කුළුණු) ඉගෙන ගැනීමට අවධානය යොමු නොකළාය. මෙකළ සලාතය

ඉටු කරන්නන් ගෙනුත් සලාතයේ අර්කාන් (කුළුණු) ගණන කිව හැක්කේ කී දෙනෙකුටද? සජදා කරන විට ස්පර්ශ විය යුතු ස්ථාන කීයද? වුළු වල පර්ළු කීයද යැයි දන්නවාද කිව නොහැක.

## පියාගේ ජනාසාව (දේහය)

පියාගේ ජනාසාව තබා ඇති අතර මොඩර්න් (විලාසිතා) පුතා මුහුණ පුම්භාගෙන දුරින් සිටියි. අසරණයා ජනාසා සලාතය ඉටු කිරීමට නොදනියි ඇයි? අභාග්‍යවන්ත පියා තම පුතුට ලෞකික දැනුම පමණක් ලබා දී ධනය රැස් කිරීමට ක්‍රම පහදා දුන්නේය. කණගාටුයි. ජනාසා සලාතයේ ඉටු කරන ක්‍රමය පැවසුවේ නැත. පියා තම පුතුට ජනාසා සලාතය ඉටු කරන ආකාරය ඉගෙන්නුවානම්, කුර් ආනය උගන්වා සිටියා නම් සුන්නතයන්ට අනුව අමල් කිරීමට පුරුදු කර සිටියා නම් මැරුණු පසු පුතා දුරින් සිටීම අවශ්‍ය ඇයි? ඉදිරියට පැමිණ ජනාZසා සලාතය මෙහෙයවා (ඉමාම් වශයෙන් ඉටුකරවා) හොඳට ඊසාලේ සවාබ් (පින් පමුණු වීම) කිරීමට තිබුණි. ආහ්! ඔහුට ඊසාලේ සවාබ් කිරීමටත් දන්නේ නැත. හායේ! අයියෝ! මැරුණු පියාගේ අභාග්‍යය.

## අභාග්‍යවන්ත දේහය (මිනිය)

ඉස්ලාමීය සහෝදරයෙක් මට මර්කසුල් අව්ලියා ලාහෝර් වල සිද්ධියක් පැවසුවා. අපේ නෑදෑයෙක් මුදල් හම්බ කර ගැනීමට පකිස්ථානයෙන් පිටරටකට ගියා. ඔහු මුදල් හම්බ කර ගෙදරට වර්ණ T.V යකුත් V.C.R එකකුත්

යැව්වා. ඉන් පසු ඔහු ගෙදර පැමිණි විට මරණයට පත් වුණා. ඉස්ලාමීය සහෝදරයා පැවසුවේ තමන්ගෙ ලොකු අයියා නෑදෑයෙකු වශයෙන් මර්හූම්ගේ දසවැනි දිනයේ මර්කසුල් අව්ලියා ලාහෝර් වලට ගියා. ගේ ළඟට ගියහම කුර්ආනය පාරායනය කිරීමත්, ආහාර පිසීමත් දැක ගන්නට ලැබුණා. ගෙය තුළට ගිය විට විශ්මිත (ආචාර්‍යමත්) දෙයක් දැක ගන්නට ලැබුණා. එනම් මර්හූම් ගේ වැන්දඹු බිරිඳ හා දරුවන් V.C.R එකෙන් චිත්‍ර පටියක් බලමින් සිටියහ. ගෙයින් පිට ඊසාලේ සවාබ් සිදු වන අතර අභාග්‍යවන්තයාගේ ගෙය තුළ පාපී ක්‍රියාවන් සිදු වෙමින් තිබුණි. මආzල්ලා අzස්zසවහ්ල්

## ආගමින් ඈත් කරවමින් සිටිති

තමන්ගේ දරුවන්ට ආදරය කරන්නෙනි! තම දරුවන්ට T.V හා V.C.R රැගෙන දුන් හොත් සමහර විට ඔවුන් ඔබේ ජනාසා, ඊසාලේසවාබ් පමණක් නොව කබ්රය වෙත පැමිණ හරියාකාරව fපාතිහාවක් වත් නොකරන්නට පුළුවන්. කියාමත් දිනයේ පරීක්ෂණය (විභාගය) ගැන බලා සිටින්නන්ගේ සිත අප හද තුළ ඉස්ලාමය ගෙන තිබුණු ස්වල්ප ආදරයෙන් ඉවත් කරමින් සිටින්නේ යැයි ඇවෙයි. බලන්න! ඉස්පාඤ (ඉස්පේන්) එක් කලක ඉස්ලාමයේ මර්කස් (ප්‍රධාන මධ්‍යස්ථානයක්)ව තිබුණි. අද එහි මස්ජිදයන් වසා ඇත. සමහර රටවල කුර්ආනය කියවීම කෙසේ වෙතත් ළඟ තබා ගැනීමටත් තහනම්ය. ඉස්ලාමීය විරෝධී රටවල මෙම කුමන්ත්‍රණය ක්‍රියාත්මක වෙමින් කෙසේ හෝ මුස්ලිම්වරුන්ගේ සිත් වලින් ආගම ගැන කැක්කුම ඉවත්

කළ යුතුයි. ඔවුන් තමන්ව මුස්ලිම් වරුන් යැයි පවසා ගත්තත් කමක් නැහැ. ඇතුළතින් හිස් ව තබා ගත යුතුයි යන චේතනාවෙන් ක්‍රියා කරති.

## මුස්ලිම්වරුන්ට මුස්ලිම්වරුන් විධියට සිටීමට ඉඩ දුන්නේ කවදාද?

එක් පකිස්ථාන මුස්ලිම් ආලිම් වරයෙකුට වෙන ආගමික නායකයෙකු සමඟ සාකච්ඡාවක් සිදු විය. කථාව අතර තුරදී පාකිස්ථානයේ අපේ ධර්ම ප්‍රචාරය සඳහා විශාල වියදම් දරන්නෙමු. එයට ආලිම්වරයා ඔබලා මේ වෙනෙතෙක් කොතරම් මුස්ලිම්වරුන්ගේ ආගම වෙනස්කරාද? කියා ප්‍රශ්ණ කළේය. බොහොම අඩුවෙන් කියා පිළිතුරු ලැබුණි. එයට ජයග්‍රාහී ලීලාවෙන් ආලිම්වරයා එනම් ඔබේ සංවිධානය අප රටේ අසමත් (අක්‍රීය) වුණා. යැයි පැවසුවේය. එයට ඔහු සිනාසී මෞලවි සාහිබ්! එය හරිය? අපිට වැඩි වශයෙන් මුස්ලිම් වරුන්ව ආගමෙන් වෙනස් කරන්න බැරි වූ නමුත් අපි මුස්ලිම්වරුන්ට ක්‍රියාවෙන් මුස්ලිම්වරුන් වශයෙන් සිටීමට අවස්ථාවක් දුන්නේ කවදාද? ඔබට ක්ලීන් ෂේව් (රැවුල බාපු) කලිසම් ෂර්ට් ඇඳපු මුස්ලිම් වරයෙකු යහුදියෙකු අතර වෙනසක් දැක ගන්න පුළුවන්ද? ඔබේ මොඩර්න් (නව විලාසිතා) මුස්ලිම් වරයෙකු හා නසාරානිවරයෙකු සම සමව තැබුවහොත් මුස්ලිම්වරයාව හඳුනා ගත හැකිද? එයට ආලිම්වරයාට පිළිතුරක් නොවීය. හිතාදර ඉස්ලාමීය සහොදරවරුණි! මෙයයි සත්‍යය. මුස්ලිම්වරුන්ගේ මෙම ඇඳුම් පැළඳුමින් සාමාන්‍යයෙන් ඉස්ලාමීය සිරිත් විරිත් නැති වී ගොසිනි. සුන්නත්වලින් දුරස් වී ඇත. මුස්ලිම්වරුන්ගේ

මුහුණ සමහරවිට නබි නායක සාහිබේ ලව්ලාක් صَلَّى اللهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم ගේ සුන්නතයේ ආකාරයට 1%ක්වත් නැතුවා ඇතිය.

## ෂෛතාන්ගේ කුමන්ත්‍රණය

කණගාටුයි! සාමාන්‍ය මුස්ලිම්වරුන්ගෙන් 99%ක් ම මුහුණෙන්, ඇඳුම් පැළඳුමෙන් අන්‍ය ආගමිකයන් වාගේ සිටිති. සමහරුන්ට මාගේ මෙම කථාව අල්ලන්නේ නැතුවත් ඇති. ඒ නිසා මා ගැන තරහක් ඇති වන්නටත් පුළුවන්. නමුත් මතක තබා ගන්න! මෙයත් ෂෛතාන්ගේ කුමන්ත්‍රණයක් පමණයි. මුස්ලිම්වරුන්ට ආගමික දෙයක් පවසන විට තරහ යයි. මක් නිසාදයත් ඔවුන්ගේ මොළයට මෙය නොවැදී නැගිට යෑමයි. මෙයටත් ෂෛතාන් හොඳට සිනාසෙයි. එසේ ලක්ෂ ගණනකින් මුස්ලිම්වරු දෑවතේ ඉස්ලාමියේ එකතුවුණත් කමක් නැහැ. ලෝකයේ කෝටි ගණන් මුස්ලිම්වරු තවමත් රැවුල බාමින් එක් මුටි (ටිපත්) වලට අඩුවෙන් තබා යුදෙව් නසාරා වරුන්ගේ මුහුණට සමාන තම මුහුණ සරසාගෙන ඊට සරිලන ආකාරයට ඇඳුම් පැළඳුම් ද භාවිතා කරති. ආහ් ෂෛතාන් මා හට සිනාසී මෙසේ කිව හැක. ඔබ කොතරම් වෙර දැරුවත් මිනිසුන් දැන් ඔබේ කථාවට එකඟ වෙන්නෙ (රැවටෙන්නේ) නැත. මම ඔවුන්ගේ සිරිත් විරිත් සියල්ල වෙනස් කර ඇත. ඔවුන්ගේ මුහුණ සහ ඇඳුම් පැළඳුම් ඔබේ මහ්බුබ් صَلَّى اللهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ගේ ප්‍රසාදරයන් ගේ මුහුණට වෙනස්ව මාගේ අනුගාමිකයන් හා නිරයේ මා සමඟ සිටින්නන්ගේ ආකාරයට වෙනස් කර ඇත. මම ඔවුන්ව අහංකාර කමින් උදම්මවා යනුවෙන් පවසනවා ඇත.

## පාපයන්ට ආම්පන්න (කාරණය)

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! මින් පෙර ගුවන් විදුලියේ ඔබේ කැමැත්ත යන තේමාවේ ගීත ඇසීමට ලැබිණි. නමුත් සියලු දෙනාටම තමන් කැමති විදියට ඇසීමට අවස්ථාවක් නොලැබිණි. ඉන්පසු ටේප් රෙකෝඩින් පරිහරණයට පැමිණීමෙන්, සියලු දෙනාටම තමන් කැමති ගීත ඇසීමට අවකාශ ලැබුණි. සමහරු මෙසේ ද කිව හැක. මම නම් ටේප් රෙකෝඩරයෙන් බයාන් හා කසීදාවන් අසන්නෙමි. ඔබ නිවැරදි විය හැක. නමුත් මම වැඩි දෙනෙකු ගැන කථා කරමි. සත්‍ය වශයෙන් ම දාහෙන් නොව ලක්ෂයකින් ස්වල්ප දෙනෙක් විය හැක. එසේ කිරාඅත්, තිලාවක්, කසීදා හා බයාන් අසන්නන් වැඩි වශයෙන් ගීත ඇසීම සඳහාම ටේප් රෙකෝඩර් මිළ දී ගනිති. එපමණක් නොව සුන්නතයන් ගැන කැක්කුමක් ඇති සමහර ඉස්ලාමීය සහෝදරවරුන් මෙසේ ද පවසා ඇත. අපි සමහර වෙලාවට ඔබතුමාගේ බයාන් නැතහොත් කසීදා කැසට් පට දැමීමට තැත් කරන විට ගෙදර කට්ටිය රංඩු කර බලෙන් ම චිත්‍රපටි ගීත කැසට් දාගෙන ඔබ තුමාණන්ටද දොස් පවරති.

## T.V හඳුන්වා දෙනු ලැබුවේ කවදාද?

ජනතාවට වැඩි වැඩියෙන් විනෝදකාමිත්වයෙන් ජීවත් වීමට ෂෙයිතාන් 1925 වැනි වසරේ T.V හඳුන්වා දුන්නේය. මුලින්ම මෙය කාfපිවරුන් වෙත පමණක් තිබුණි. ඉන් පසු මෙය මුස්ලිම් වරුන් වෙත ද පැමිණ ඇත. එසේ ම මුලින් මෙය විශේෂ ස්ථානයන් වල පෙන්වන විට විශාල

වශයෙන් ජනතාව රැස් වී බලා සිටියහ. ඉන්පසු ටිකින් ටික ගෙවල් වලට රිංගුවේය. නමුත් ඒ අවස්ථාවේ එය බ්ලැක් එන්ඩ් වයිට් (කළු සුදු) ව තිබුණි. ඉන් පසු එය වර්ණ කර ෂෛතාන් ජනතාව අවාලේ කර දැමීය. ඉන් ටික කලකට පසු පාකිස්ථානයට V.C නැමැති මහා විනාශයක් පාත් විය. ජනතාව හොරෙන් හොරෙන් හැංගි හැංගි රු10/- රු10/- ගානේ චිත්‍ර පටි බැලීමට විය. ඒ කාලයේ ම, V.C.R වෙනුවෙන් ලක්ෂ 2ක් අවසර පත්‍ර ලබා දී ඇති බවට කරාච්චියේ පත්‍රයක සඳහන් වී තිබුණි. මෙතෙක් අල්ලස් දිදී ජනතාව කල වැරදි ක්‍රියාව දැන් ප්‍රසිද්ධියේ කිරීමට "ආණ්ඩුවෙන් ආරක්ෂාවක්" ද ලැබෙන්නට විය. දැන් ගෙවල් වලට ද V.C.R පැමිණී ඇත. මතක තබාගන්න රටේ නීතිය යම්කිසි පාපී ක්‍රියාවකට අවසර දුන්හොත් එය පිළිගනු නොලැබේ.

## නිරයේ පැනීමට තර්ජන

එක් වතාවක් තරුණයෙක් පැමිණ මට මෙසේ පවසා සිටියේය. රන්චෝඩ්ලයින් බාබුල් මදීනා කරාච්චි ප්‍රදේශයේ ඔබතුමාණන්ගේ සුන්නතයන් පිරිණු බයාන් අසා රැවුල තැබුවෙමි. මාගේ මව මට රැවුල තැබීමට ඉඩ නොදෙන්නීය. ඔබ රැවුල ඉවත් නොකරන්නේ නම් මම වස කාල මැරෙනවා යැයි තර්ජන කරන්නීය. මෙය කාෆිර් ළමයෙක් නොව මුස්ලිම් ළමයෙක් ඔහුගේ මවත් මුස්ලිම් යැයි පවසමින් සුන්නත් ක්‍රියාවන් කිරීමට ඉඩ නොතබමින් තමන් සිය දිවි නසා ගන්නා බවට තර්ජනය කරන්නීය. එනම් පුතා රැවුල බාන්න නැතහොත් මම නිරයට

පනිම් යැයි තර්ජනය කරන්නීය. ආහ්! තමන් මුස්ලිම් යැයි පවසන්නන්ගේ සුන්නතයන් වලින් මෙතරම් දුරක්! الْأَمَانُ وَالْحَفِيظ!

## මෝඩ කථිකාචාර්යවරයා

සමහරු මෙසේ ද පවසති. T.V වල හොඳ දේවලුත් පෙන්නනවා. පෙන්වන්න පුළුවන් නමුත් මටත් පැවසීමට ඉඩක් දෙන්න. මෙම T.V ඇත්ත වශයෙන් ම භයංකාර අන්දමින් අනාචාරශීලී භාවය ඇති කළා පමණක් නොව ඉස්ලාමීය සමාජය විනාශයේ මුඛයට තල්ලු කර දැම්මේය. එක් වතාවක් P.T.V. වල කථිකාචාර්යවරයෙක් පැමිණි ප්‍රශ්ණ උත්තර දෙන වෙලාවේ රැවුල ගැනත් ප්‍රශ්ණය පැමිණ ඇත. එයට පිළිතුරු දෙමින් රැවුල තැබීමත් හරි නොතැබීමත් හරි රැවුල නොතැබීම පාපික්‍රියාවක් නොවෙයි. යැයි පැවසීය. ඉන් පසු දෙමව්පියන් තම තරුණ පුතුට නොයෙකුත් ඇනුම් පද කීමට පටන් ගත්හ. දෑවතේ ඉස්ලාමීවරු තමන්හට කෙතරම් තද නීති රීති පනවා ඇත්ද? මෙතරම් ලොකු කථිකාචාර්යවරයාම පවසා සිටින්නේ රැවුල නොතැබීම පවක් නොවන බව නමුත් ඔබලා කියන්නේ පවක් බවයි. ආගමික ඥාණයක් නොමැති එම මෝඩ කථිකාචාර්යවරයා ෂරීඅතයට අනුව අමල් නොකරන ජනතාවගේ හිත සුව සඳහා දුන් පිළිතුරෙන් කොතරම් මුස්ලිම්වරුන්ගේ මොළය නරක් වී ඇත්ද? නමුත් صَلَّى اللهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ගේ ආදර ශක්තියෙන් පිරුණු සිත්වලින් මෙසේ ශබ්දයක් පිටවෙයි. "මා ප්‍රිය කරන්නේ මට හොඳ යැයි සිතන්නේ හිසමත ඉමාමා ද මුහුණේ රැවුල ඇත්තාය."

# තම ආත්මයට (සිත) හා ෂෛතාන්ට විරුද්ධව ජිහාද්

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි කොතරම් කුමන්ත්‍රණකාරීව ඉස්ලාමයට අලාභ සිදුකරන්නේ දැයි තේරුම් ගියාද? ඇයි අපට මොකුත් කරන්න බැරිද? ඇයි අපට කරන්න බැරි! සිතෙන් කන්සලු විය හැක. මෙසේ සවාබ් රැස් කරගත හැක. මෙය කිරීමෙන් ෂෛතාන් හා තම (සිත) ආත්මයට විරුද්ධව අපේ මදනි වැඩ කර ගෙන යා හැකිය. ඉන්ෂා අල්ලාහ් තආලා (සුන්නතයන් පතුරවන්න ආගමේ වැඩ කරන්න)

# පියාගේ අවසන් යුතුකම්

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි. තනියෙන් සිට කල්පනා කරන්න. එක් අවස්ථාවක මෙසේ ද සිදු විය හැක. ඔබේ නම පවසා ඔබේ මරණය දැනුම් දෙනු ලැබෙනු ඇත. ඉක්මනින් නාවන්නා අඩගසන්න පවසනු ලැබේ. දැන් ඔහු පැමිණෙයි. ඔබව සුදු රෙද්දකින් වසා තිබේ. හිස නිකට සමඟ බැඳ ඇත. කකුලේ මා පටැඟිලි දෙක එකට බැඳ ඇත. නාවන්නා ඔබව නාවයි. ඔබේ දරුවන්ට ඔබව නාවන්නටද බැරිය. සමාවෙන්න! කුඩා කාලයේ සිටම දරුවට දැනුම් තේරුම් ඇති වයසට පැමිණෙනවාත් සමඟ ඔවුන්ට පාසල් යෑමට පුරුදු පුහුණු කළා ලොකු වූ විට කොලේජ් වලට ඇතුළු කළා. ඉන්පසු වැඩි දුර අධ්‍යාපනය සඳහා ඇමරිකාවට යැව්වා. විභාගවලින් සමත් වීමට උනන්දු කළා. නමුත් දීන් (ආගම) ඉගැන්වූයේ නැත. එසේ නම් මයියතය නාවන්නේ කෙසේද? ඔහුට තම ජීවිතයේ

දී ම ගුස්ල් (නෑමේ) සුන්නතය දන්නේ නැහැනේ. ආහ්! ආහ්! හරිනම් පියාට කරන අවසාන හිද්මත් (සේවය, උදව්ව) නම් පුතා මයියතය නෑවීම කfපන් කිරීම, ජනාසා සලාතය ඉටු කිරීම හා තම අත්වලින් ම භූමිදානය කිරීමයි. පුතා නාවන විට භය භක්තියෙන් අඬ අඬා සියලු සුන්නතයන්ම අත පසු නොවීමට වග බලා ගනියි. නමුත් ගස්සාල් (නාවන්නා) නාවන විට සුන්නතයින් ගැන එතරම් උනන්දුවක් නොදක්වා කfපන් අන්දවා සාක්කුවේ සල්ලි දමා ගෙන පිටත් වන්නේය.

## මයියතය (මරණය)ට අඬා වැලපීමේ අzසාබ් (වේදනාව)

දැන් මරණය (දේහය) ගන්නා විට ස්ත්‍රීන් අඬා වැලපෙන්නට පටන් ගනිති. නමුත් මැරුණු පුද්ගලයා ඔවුන්ට වැළපීමෙන් (විලාප) වැළකී සිටීමට පවසා නැත. එසේ විළාප (බෙරිහන්) දීම හරාම් වන අතර නිරයට ඇද දැමිය හැකි බව පවසා ද නැත. හදීසයේ මෙසේ සඳහන් වී ඇත. අඬා වැළපෙන්නියන් මරණයට පෙර තව්බා නොකර මැරුණොත් කියාමත් දිනයේ ඇයව නැගිටු වන්නේ ඇඳුම් දෙකක් පළඳවමිණි. එකක් කක්රාන් (ඇලෙන සුළු තාර වර්ගයක්) වලින් හා එකක් හොරි (සරම්ප) වැනි සමට හානිකර වන ඇඳුම් වලිනි.

## ජනාසාවට උර දෙන ක්‍රමය

සමහර අවස්ථාවන් වල ජනාසාව රැගෙන මිනිසුන් යන විටත් පුතාට නියමාකාරයේ ජනාසාව උර දීමට නොදැන බලා සිටියි. මක් නිසාද යත් මැරුණු පියා ඔහුව

දැනුවත් කර නොමැති වීමයි. ඒ අසරණයා දන්නේ කෙසේ ද? සුන්නතයට අනුව ජනාසාවකට උර (කර) දෙන්නේ කොහොම ද කියා ද ජනාසාවකට උර (කර) දෙන ක්‍රමය කෙසේ ද කියා අසා ගන්න! සුන්නතය මෙයයි. තමන්ගේ දකුණු උර මත මයියතයේ ඉදිරිපස (හිස තිබෙන පැත්ත) තබා ගෙන අඩි 10ක් යන්න. ඉන් පසු තමන්ගේ දකුණු උර හිස මත මයියතයේ පිටුපස පාදය පැත්ත තබාගෙන අඩි 10ක් යන්න. ඉන්පසු තමන්ගේ වම් උර හිස මත මයියතයේ පිටු පස (පාදය පැත්ත) තබාගෙන අඩි 10ක් යන්න. ඉන්පසු තමන්ගේ වම් උර හිස මතම මයියතයේ පාදය පෙදෙස තබා ගෙන යන්න. මෙසේ යන විට අඩි 40ක් ජනාසාව රැගෙන (උස්සාගෙන) යෑමක් සිදු වන්නේය. මෙයයි සුන්නත් වූ ක්‍රමය. අත්තබරානිපිල් අව්සත් හදීසය.5920 කො:4 පි:260 දාරුල්කුතුබුල් ඉල්මීය බේරුත්)

## ජනාසාවකට උර දීමේ මහිමය

හදීසයේ සඳහන් වන්නේ යම් කිසිවෙක් ජනාසාවක් රැගෙන අඩි 40 යන විට ඔහුගේ ලොකු පව් (පාපි ක්‍රියාවන්) 40 කටම සමාව ලැබෙන්නේය. තවද (අල්ජව්හතුන්නයියරාහ්) වල සඳහන් වන්නේ යම් කිසි කෙනෙක් ජනාසාවල සිව් දෙසටම උර(කර) දෙන්නේ ද අල්ලාහ් ඔහුට ස්ථිර වශයෙන්ම සියලු පව් වලට සමාව ලබා දෙයි. (කොටස 1 පිටුව 139)

## කබ්රයේ ආලෝකය ගැන නොසිතා සිටීම

ලෝකයේ වාසය කිරීම සඳහා දිග පළලින් යුතු ලොකු ගෙවල් (නිවාස) සාදනු ලැබුවත් කබ්රය සුන්නතයට අනුව නොහැදීම කණගාටුවට කරුණකි.

නිවසේ විශාලත්වය ගැන සිතන අයට කබ්රයේ පුළුල් (දිග පළල) ගැන සිතන්නේ නැත. ලෝකයේ විසීමට ඉදිරියේ ආලෝකය (එළිය) ගැන සිතන්නන් කබ්රයේ ආලෝකය (එළිය) ගැන සිත්නනේ නැත. ඒ ගැන සිතීමට වේලාවක් නැත. නමුත් කබ්රය ද පසු කාලයේ සිටිය යුතු (වාසය කළ යුතු) ස්ථානයකින් එකකි. ගෙවල් වල ආලෝකමත් කිරීම සියලු දේ පිළිවෙළට කළත් කබ්රයේ ආලෝකය ගැන සිතන්නේ කවුද? ලෝකයේ ධනය රැස් කිරීමට සියලු දෙනාට ම ලොකු හදිස්සියක් තිබුණ නමුත් පින්(කුසල්) රැස් කිරීම ගැන තැකීමක්වත් කාටවත් නොමැත. ජීවිතයේ යහපත ගැන සිතනවා මිස ඊමානයේ යහපත ගැන සිතන්නට අවකාශයන් ඉතාමත් අල්පය.

## නීරෝගීකම මිළදී ගත නොහැක

මතක තබා ගන්න! ධනයෙන් බෙහෙත් ගත හැකි වුවත් සුවය(නීරෝගීකම) ගත නොහැක. එසේ සුවය (නීරෝගීකම) මිළදී ගත හැකි නම් ලොකු ලොකු ධනවතුන් දෙපය පොළවේ ගස ගසා ඉස්පිරිතාලවල (හොස්පිටල්) මැරෙන්නට අවශ්‍යතාවයක් ඇති වන්නේ නැත. ධනය දුක් කරදර වේදනාවන් වලට ප්‍රතිකර්මයක් නොවන්නේය. සත්‍ය නම් ධනය සියලුම ප්‍රශ්න වලට මුලයි. සොරකම්, ළමයි පැහැර ගැනීම්, කප්පම් ගැනීම් යනාදි සියල්ල වැඩි වශයෙන් සිදු වන්නේ ධනවතුන්ටයි. ධනය වැඩි වශයෙන් සිත සන්සුන් කරන එකට වැඩිය නොසන්සුන් (සංසල) කරයි. සැනසිල්ල නැති කරයි. නමුත් පුදුමය නම් මිනිසුන් (ජනතාව) ධනය රැස් කිරීමටම පොර කමින් සිටිති.

# ධනවතුන් හා රෝගාබාධයන්

ලොකු ලොකු ධනවතුන් දෙස බලන විට දකින්නට ලැබෙන දෙයක් නම් කිසියම් ප්‍රශ්ණයක් ඇති බවයි. සමහරු දරුවන් නොමැති කමින් ද, තවකෙනෙකුගේ මව ලෙඩ, කෙනෙකුගේ පියා ලෙඩ, ඒ වාගේ ඔබට ධනවතුන් කී දෙනෙක් හමු වී ඇත්ද? හෘද රෝගයෙන් පෙළෙන්නන්? සමහරු දියවැඩියා රෝගයෙන් පෙළෙති. කොතරම් කෝටිපතියෙක් කොතරම් රස කැවිලි ඉදිරියේ තිබුණත් කටේ තබා රස බැලිය නොහැක. ඒ අසරණයා තම ධනය, වස්තූන් ගැන සිතා සිත සනසා ගනිති. එහෙත් ධනය රැස් කිරීමේ තණ්හාව නම් සිතෙන් ඉවත් වන්නේ නැත. විශ්වාස කරන්න කොතරම් රැස් කළත් කරන්නේ නම් මෝඩකමකි. මේ සියලු ධනය, වස්තූන් තබන්නේ කෙසේද? මීට පෙර සිටි ලොකු ලොකු මුදලාලිලත් අන්තිමට මරු කටට ගියා නේද? යැයි සිතන්නේ නැත. ඔවුන්ගේ මුදල්, වස්තූන්, ඔවුන්ට දුන් ප්‍රයෝජන කුමක්ද? අන්තිමට තම උරුමක්කාරයන් අතර ආරවුල් ඇති කරමින් උසාවිවලට පත්තරවලටත් ගොස් බෙදී ගිය බව වත් සිතන්නේ නැත.

# කාfපිර් වරුන්ගේ කරදර හා (අඩත්තේට්ටම්) පීඩා මැද හිංසා

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! අද ලොව පුරාම කාfපිවරුන්ගේ කරදර වලට මුස්ලිම් වරුන්ට මුහුණ පෑමට සිදු වී ඇත්තේ අපේ පාප කර්ම වලට දඬුවමක් වශයෙන් ද කිව නොහැක. අකාරුණික කාfපිර්වරුන්

මුස්ලිම්වරුන්ගේ කුඩා ළඳරුවන් පෙති ගසමින් අහිංසක නිරායුධ මුස්ලිම්වරුන් ඝාතනය කරමින් ගෙවල් දොරවල් ගිනි තබමින් විනාශ කරමින් සිටිති.

මානව හිමිකම් ගැන කථා කරන්නන් කිඹුල් කඳුළු සලමින් එම ක්‍රියාවට අනුබල දෙමින් සිටිති. අපගේ දෙවියාණෙනී, කරුණාවන්ත අල්ලාහ් අස්zසවජල් මුස්ලිම්වරුන් වන අපගේ පාපයන් කමා කරනු මැන එසේම අපගේ මුස්ලිම් සහෝදරයන්ට කාfපිර්වරුන්ගෙන් සිදුවන කෲර වද හිංසාවන් වලින් ආරක්ෂා කරනු මැන. ආමීන් බිජාහින්නබීයිල් අමීන්

## කබ්රයේ (සොහොනේ) ප්‍රශ්ණ හා පිළිතුර

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! ඔබ මෙසේ සිතා බලන්න. දිනක මාගේ දේහය කබ්රයේ තබා පස්වලින් වසා නෑදෑයන් හිත මිතුරන් සියලු දෙනාම පිට වෙති. එවිට සුවඳවත් ගෙවතු ලෙල දෙන වෙල් යායවල් නවීන පන්නයේ දිලිසෙන වාහන, අලංකාරවත් ගෙවල් දොරවල් කිසිවකින් ප්‍රයෝජන නොලැබෙන්නේය. භයංකාර පෙනුමකින් යුත් “මුන්කර්” “නකීර්” යන මළඉකා වරුන් දෙදෙනෙක් කබ්රයේ බිත්තිය කඩාගෙන ඇතුළු වෙති. හිස සිට පාදය දක්වා දිගැති හිසකෙස් ද ගිනි පුළුගු ආකාරයේ දෑසින් යුත් ඔවුන් ඔබෙන් ප්‍රශ්ණ කිරීම ආරම්භ කරති. එයත් කරුණා දයාවෙන් නොව තදින් භයංකාර හඬකින් යුතුව ප්‍රශ්ණ කරති. 1) مَنْ رَبُّكَ එනම් ඔබගේ දෙවියා කවුරුන්ද? 2) مَادِيْنُكَ ඔබේ ආගම කුමක්ද? 3) مَا كُنْتَ تَقُوْلُ فِيْ حَقِّ هٰذَا الرَّجُلِ،

ඉන්පසු ඉතාමත් පියකරු පැහැපත් ස්නේහවන්ත සියලු දෙනාම දැක ගැනීමට පෙරුම් පුරමින් බලා සිටින එම රූපකාය පෙන්වමින් එනම් මෙම තැනැත්තා පිළිබඳව ඔබ කුමක් කියන්නේද? සලාතය ඉටු කරන්නෙණී! එක මිටක ප්‍රමාණය රැවුල තබන්නෙණී! සුන්නතයට අනුව සුzල්පා (හිස කෙසේ) වවන්නෙනි! තම හිස ඉමාමා ෂරීfපයෙන් සරසා සිටින්ණෙනී! සුන්නතයන් ඉගෙන ගැනීම සඳහා කාfපිලා වල ගමන් කරන්නෙනී! සෑම මාසයේ මදනි ඉනා ආමාත් කාඩ් පුරවා බාර දෙන්නෙනී! ඉන්ෂා අල්ලාහ් තආලා සත්‍ය වශයෙන් ඔබට ජය ගත හැකිය. අල්ලාහ් තආලා සහ රසූල් صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමාණන්ගේ කරුණා දයාවෙන් ඔබට නියම පිළිතුර ලබා දීමට හැකි වනු ඇත. رَبِّىَ اللّٰه එනම් මාගේ රබ් (දෙවියා) අල්ලාහ් ත ආලා دِيْنِىَ الْاِسْلَام එනම් මාගේ ආගම ඉස්ලාම් එසේ ම එම පියකරු රූපය ඇති තැනැත්තා දෙස බලා ඉන්පසු අල්ලාහ් හා ඔහුගේ හබීබ් ගේ පිහිටෙන් ඔබේ පිළිතුර මෙසේ විය හැක. هُوَ رَسُوْلُ اللّٰه මෙතුමාණන් අල්ලාහ්ගේ හිතාදර රසූල් තුමාණන් යැයි සතුටින් ඉපිළමින් පවසා සිටින්නේය. "සර්කාර් ගේ සම්ප්‍රාප්තිය මර්හබා දිල්දාර්ගේ සම්ප්‍රාප්තිය මර්හබා කබ්රයේ සර්කාර් පැමිණි විට පාමුල වැටේ. මළාකාවරුන් නැඟිට වූ විට මෙසේ පවසමි. එතුමාණන්ගේ පාදයන් අසලින් මා කෙසේ නැගිටිම්ද? මැරුණු පසු පැමිණියෙමි එතුමානන්ගේ පිහිටෙන්." සලාතු සලාමයෙන් උද්දාමයට පත්වන්නෙනී! මුහම්මද් යන නාමය ඇසූ පමණින් ඇඟිලි සිප ගන්නෙනී! නායකතුමාණන් නැවත පිටත් වීමට සැරසෙන විට ඔබේ මුවින් මෙසේ පිටවනු ඇත.

“සිතත් පිපාසයෙනි, ඇසත් පිපාසයෙනි මෙතරම් ඉක්මනට පිට වන්නේ ඇයි.”

“නවතිනු මැන, නවතිනු මැන මාගේ ප්‍රාණය අප සිත පිරුණ තෙක් නොදුටුවෙමු.”

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! කෙසේ වෙතත් අවසන් ප්‍රශ්ණ උත්තරය අවසන් වූ විගස නිරයේ ජනේලයක දොරක් විවෘත කර විගසට වසා දමනු ලැබේ. ඉන් පසු ස්වර්ගයේ දොරක් විවෘත කරනු ලබන අතර ඔබ නියමාකාරයෙන් පිළිතුරු නොදුන්නේ නම් මීට පෙර විවෘත කල නිරයේ දොරටුවයි ලැබීමට තිබුණි. යනුවෙන් පවසනු ලැබේ. එය ඇසෙත්ම ඔහු ප්‍රීතියෙන් ප්‍රීතියට පත් වෙයි. ඉන් පසු ඔහුට ස්වර්ගයේ කfපන්, ස්වර්ගයේ ඇතිරිලි ලැබෙන අතර කබ්රයේ ඇස නොගැටෙන මානයට විශාල කර දෙනු ලබන නිසා සතුටින් සිටීමට අවස්ථාව ලැබෙන්නේය.

## කබ්රයේ ප්‍රශ්ණවලට පිළිතුරු දීමට නොහැකි වීමට හේතු

සලාතයන් අත පසු කරන්නන් බොරු කියන්නන් අනුන් ගැන කේලම් දොස් කියන්නන් තහනම් මාර්ගයෙන් උපයන්නන් චිත්‍රපට බලන්නන් පෙන්වන්නන් ගායකයන්, ගයන්නන් අසන්නන් මුස්ලිම්වරුන් දුකට පත් කරන්නන් අල්ලාහ් තආලා කෝපයට පත් වී සිටියා නම් උත්තම නායක صلی اللہ تعالیٰ علیہ والہ وسلم තුමාණන් ඔබ සමඟ අසතුටින් සිටියා නම් ඔබේ ඊමානය විනාශ වී හමාරයි. එසේ නම් සෑම ප්‍රශ්ණයටම මුවින් පිට වන පිළිතුර නම් පාපි ක්‍රියා වල

විපාකය නිසා هَيْهَاتَ هَيْهَاتَ لَا اَدْرِى (කණගාටුයි කණගාටුයි මා නොදනිමි) යන්නයි. අනේ ඇස් ඇරුණු වෙලේ සිටි T.V බලමින් කතින් ගීත අසමින් සිටියෙමි. අල්ලාහ්තආලා කවුරුන් දැයි මා දන්නේ කෙසේද? ආගම යනු කුමක් දැයි? මා දන්නේ කෙසේද? මා දැන සිටියේ ආගම දහම නම් නිකරුණේ ධනය උපයමින් එක්රැස් කරමින් අඹුදරුවන් රැකීම යනුවෙන් පමණි. යම් කෙනෙක් සුන්නතයන් වලින් පිරුණු මදනි ඉජ්තිමා වලට අඬ ගැසූ විට හෝ මදනි කාfපිලා වල යෑම අඬ ගැසූ විට මා හට වැඩ ගොඩ ගැසී ඇති නිසා පැමිණිය නොහැකි බව පවසමින් මුදල් හම්බ කිරීමේ යෙදී සිටියෙමි.

ඉස්ලාමීය සහෝදරවරුණි! දැනට නම් මෙසේ පිළිතුරු දිය හැක. එය පිළිගැනීමට ද හැකිය. ව්‍යාපාරයන් දියුණුව කරා යා හැකිය. තවද බැංකුවේ ඉතිරි කිරීම් ද වැඩි කර ගත හැක. නමුත් මතක තබා ගන්න.

“මුදලාලිලා සිතන්නේ එකක් දහයක් කර ගැනීමටයි. මරණය පැමිණ කරන්නේ මිස්ටර් ජාන් (ප්‍රාණය) නැවත ඉල්ලීමයි.”

කෙසේ නමුත් පිළිතුර නියමාකාරයෙන් දීමට නොහැකි වූවන්ට අවසන් ප්‍රශ්ණයට පසු ස්වර්ගයේ දොරටුවක් විවෘත කර වසා දමනු ලබන අතරම නිරයේ දොරටුව විවෘත කරනු ලැබේ. ඉන් පසු ඔබ නියමාකාරයෙන් පිළිතුරු දුන්නේ නම් කලින් විවෘත කළ ස්වර්ගයේ දොරටුවයි, විවෘත වීමට තිබුණේ. දැන් ඔබට මෙම දොරටුවයි පවසණු ලබන අතර ඔහු බියටත් කනස්සල්ලටත් පත් වන්නේය. ඉන් පසු ගින්දරෙන් කfපන් අන්දවනු ලැබේ. ගින්නෙන්

තැනූ ඇතිරිලි දමනු ලැබේ. නයි හා කෘමීන් (ගෝනුස්සන්, හුම්බුළුවන්) දෂ්ඨ කිරීමට වෙලා ගන්නේය.

"අද මදුරුවාගේ දෂ්ඨ කිරීම දරා ගත නොහැකිය.

කබ්රයේ කෘමීන්ගේ (ගෝනුස්සන්, හුම්බුළුවන්) දෂ්ඨ කිරීම දරාගන්නේ කෙසේද?

අල්ලාහ් තආලා මුඃමීන් වරුන්ට 28 වැනි ජුසුවල මෙසේ අවවාද කරන්නේය.

يَٰٓأَيُّهَا ٱلَّذِينَ ءَامَنُوا۟ لَا تُلْهِكُمْ أَمْوَٰلُكُمْ وَلَآ أَوْلَٰدُكُمْ عَن ذِكْرِ ٱللَّهِ තේරුම කන්සුල් ඊමාන් :- විශ්වාසවන්තයෙනී! ඔබගේ වස්තු ද ඔබගේ දරුවන්ද අල්ලාහ් ව සිහිපත් කිරීමෙන් ඔබව නොවලක්වත්වා! (සුරතුල් මුනාfපිකූන් - ආයත් 9)

## තව්බා කර ගන්න

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි. හලාල් රිzස්ක් (ආහාර පාන) සෙවීමේදීත් සලාතයන් අතපසු නොවීමට වග බලාගන්න. එකවරම භූමි කම්පාවක් නැත්නම් බස්, කාර්, කෝච්චි පෙරළුණහොත්, බෝම්බයක් පිපුරුණහොත් මිනී කලු ගැසෙති. තවද අහසේ ගුවන් යානා පිපිරුණු විට ශරීරයේ කැබලිත් නොලැබී යන්නේය. විශේෂයෙන් හරාම් ලෙස ඉපයීම් වලින් මිදී තව්බා කර ගන්න. අල්ලස් ගැනීම් පොළී ගනු දෙනු වලින් ද මිදී සිටින්න T.V හා V.C.R ඔබේ නිවෙසින් ඉවත් කරගන්න. මතක තබා ගන්න මරණයට පසුව අපට පැවසීම කිසිවෙකු නොසිටි බවත් නොපවසන්න. නොයෙකුත් ආකාරයෙන් වැරදි හා පාප කර්මයන් වල යෙදී සිටින්නන්ට බිය විය යුතුය.

පාප කර්මයන් නිසා ඊමානය විනාශ වූවා නම් ඔබ කුමක් කරන්නේද? 24 වැනි ජුසු වල මෙසේ අවවාද කරන්නේය. (සුරතුර්zසුමර් ආයත් 54)

وَأَنِيبُوٓا۟ إِلَىٰ رَبِّكُمْ وَأَسْلِمُوا۟ لَهُۥ مِن قَبْلِ أَن يَأْتِيَكُمُ ٱلْعَذَابُ ثُمَّ لَا تُنصَرُونَ

**තේරුම කන්සුල් ඊමාන් :-** අල්ලාහ් ඔබට දඬුවම් පැමිණීමට පෙර තොප හිමි තැනට හැරෙන්න. එයට පසු ඔබට උදව් නොකරනු ලබන්නාහුය.

"යා අල්ලාහ් මාගේ ඊමානය ආරක්ෂාකරනු මැන.
දෙළොවෙහි අල්ලාහ් කරුණාව දක්වනු මැන."

# අපි ටිකින් ටික කුඩා වන්නෙමු

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! ජීවිතය ගැන බලාපොරොත්තුවක් තබා ගෙන සිටිය හැකිද? ඔබේ ශරීර සෞඛ්‍යය කොතරම් හොඳට පැවැතුණත් (එක්වරම භූමිකම්පාවක් හෝ බස්, කාර්, කෝච්චි යනාදිය පෙරළුණු විට බෝම්බයක් පිපිරුණු අවස්ථාවේ දී මිනී කඳු ගැසෙන්නේය. එසේම අහසේ දී ගුවන් යානයක් පිපුරුණු විට ශරීරයේ කැබලි ද නොලැබී යන්නේය.) එසේ අනතුරක් විනාශයක් සිදු වූ විට කුමක් කියන්නද? කිසිම තනතුරකින් ප්‍රයෝජනයක් නොවනු ඇත. මිනිසා එක තත්පරයකින් මරණයට පත් වන්නේය. මොහු ඉතාමත් වටිනා හුස්ම විටක වේගයෙන් පිට කරන්නේය. ඔබ සමහර විට කියන්න පුළුවන් මගේ පුතාගේ 12 වැනි උපන් දිනයයි. කොතරම් ලොකු වෙලාද? කියා සිතිය හැක. සත්‍ය වශයෙන් ඔබේ දරුවා කුඩා වෙමින් යන්නේය. කුමක් නිසාද නම් ඔහුත්

දිනෙන් දින මරණයට ළඟා වීමය. ඒ ආකාරයෙන් අප සැමගේ වයස අඩු වෙමින් යන්නේය. ඔරලෝසුවේ දිවෙන සෑම පැයක්ම අපගේ වයස පැයකින් අඩු වන බව දැනුම් දෙන්නේය.

## ලෞකික විභාගයට ඇති විශේෂත්වය

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! කබ්රයේ පරීක්ෂණ අවසන් වූ පසු කියාමත් දිනයේ පරීක්ෂණයට මුහුණ දීමට සිදු වන්නේය. කණගාටුවට කරුණක් නම් අප ළඟ නම් එයට මුහුණ දීමට කිසිම උනන්දුවක් නොමැත. නමුත් පාසලේ හා වෙනත් ලෞකික පරීක්ෂණ වලට සියලු දේ කැප කරමින් සමත් වීමට උත්සාහ කරති.

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! "مَنْ جَهَدَ وَجَدَ (උත්සාහ කරන්නට ලැබෙන්නේ) යන කියමනට අනුව නම් කෙනෙක් මෙලොවට උත්සහ කළ විට ඔහුට ලෞකික දේවල් පමණක් ලැබෙන්නේය. නමුත් ආහිරතයට කුමක් කරන්නේද? දවසක අපිත් මරණයට පත් වන බව ඔබ නොදන්නේද? කබ්රයෙ හා කියාමතයේ පරීක්ෂණ වලට මුහුණ දීමට සිදුවන බව නොදන්නවාද? එහි පරීක්ෂණ වල රැවටීම නොමැත. අල්ලස් ද දිය නොහැක. දෙවන අවස්ථාවක් ද නොලැබේ. මෙසේ සියලු තොරතුරු දැන ගෙනත් ලෞකික පරීක්ෂණයට මුහුණ දීමට උත්සාහය හා උනන්දුවක් ඇතත් ආහිරතයේ (කියාමත්) පරීක්ෂණයට මුහුණදීමට උත්සාහයක් හෝ උනන්දුවක් නොමැත. තැකීමක් නොමැත. නමුත් ලෞකික පරීක්ෂණයන්ට පිළිතුර දීමට දිවා රාත්‍රී උත්සහායන් වල නිරත වී සිටිති. රාත්‍රියේ

නිදිමතක් නොමැතිව සිටීමට (ANTY SLEEPING) පෙති ද ගිල දමති. නමුත් කියාමත් දිනයේ පරීක්ෂණය සඳහා කවුරුන් හෝ රාත්‍රියේ අවදි වී ඉබා දත් කරන්නේද? ලෞකික විභාගයන් (පරීක්ෂණ) වලට මුහුණ දීමට පාසල්, කොලේජ් වලට නොවරදවාම යන්නෝය. ලෞකික විභාගයෙන් සමත් වීමට නෝට්ස් ලබා ගැනීමට ටියුෂන් වලට සහභාගී වීම යනාදිය කරති. නමුත් ආඛිරතය වෙනුවෙන් සුන්නතයන් පිරුණු මදනි මාහෝලය එකතු වුණාද? මොවුන් කියාමත් දිනයේ පරීක්ෂණයට පිළිතුරු ලබා ගැනීම සඳහා සුන්නතයන් වලින් පිරුණු ඉජ්තිමා වලට සහභාගී වන්නේද?

එසේම ලෞකික දැනුම ලබා පරීක්ෂණ (විභාග) වලින් සමත් වීම (HIGHER EDUCATION) සඳහා රට රටවල් වලට ගමන් කරති. නමුත් කියාමත් දිනයේ විභාගය (පරීක්ෂණයෙන්) සමත් වීමට දඃවතේ ඉස්ලාමයේ සුන්නතයන් පිරුණු මදනි කාfපිලා වල අල්ලාහ් තආලා වෙනුවෙන් ගමන් කරන්නේද? ලෞකික පරීක්ෂණයෙන් සමත් වීමට බලා සිටින සහෝදරවරුණි! ආඛිරතයේ (කියාමත් දිනයේ) සිදුවන ස්ථිර විභාගයට මුහුණ දීමට දැන් සිටම සූදානම් වන්න. එයින් සමත් වූවානම් ස්වර්ගයේ සියලු සැප සම්පත් සමග සැමදා සිටිය හැකි අතර අසමත් වූවානම් සැමදා නිරයේ ගින්නේ සිටීමට සිදුවන්නේය. ආඛිරතයේ විභාගයට සහභාගී වීමට (මුහුණ දීමට) සූදානම් වීම සඳහා පහසුම ක්‍රමය නම් දඃවතේ ඉස්ලාමියේ සතිපතා සිදු වන සුන්නතයන් පිරුණු ඉජ්තිමාවට අනිවාර්‍යයෙන් සහභාගී වීමයි. තම ප්‍රදේශයේ මදර්සතුල් මදීනා (වැඩි හිටි) කුර්ආන් මද්රසා වේ නොමිළේ කුර්ආනය ඉගෙන ගන්න සෑම මාසයේම අඩු තරමින් දවස් තුනක් මදනි කාfපිලාවේ

පිටත් වන්නට අදිටන් කර ගන්න. සෑම මාසයේ ම මදනි ඉනාමාත් කාඩ්පත පුරවා නිසි බලධාරියාට භාර දෙන්න. එසේ කිරීමෙන් ඉන්ෂා අල්ලාහ් අස්zසැzවජල් ඔබට කියාමත් දිනයේ පරීක්ෂණයේ දී ලොකු ප්‍රයෝජනයක් ලැබිය හැක.

"රහ්මතයෙන් ලබාගත් කාfපිලාවේ ගමන් ගන්න. බරකතයන් (සෞභාගයන්) ලැබීමට කාfපිලාවේ ගමන් ගන්න. ප්‍රශ්නයන් නිමා වීමට කාfපිලාවේ ගමන් ගන්න. දුක් කම්කටොළු දුරු වීමට කාfපිලාවේ ගමන් ගන්න."

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! ඔබට දෑවතේ ඉස්ලාමියේ බරකතයෙන් ලැබූ භාග්‍යයක් පිළිබඳව සිද්ධියක් පවසන්නම් එය අසා ඉන්ෂා අල්ලාහ් ඔබේ ගතට සිසිලක් දැනෙනු ඇත.

## නවීද් අත්තාරීට කරුණාව

දෑවතේ ඉස්ලාමීය මදනි පරිසරය (මාහෝල) සමඟ සිටි අවුරුදු 17ක් සුල්තාන් මුහම්මද්ගේ පුත් මුහම්මද් නවීද් අත්තාරී 18 රජුබුල් මුරජ්ජබ් 1421හි උදේ 8ට පමණ මරණයට පත්විය. ඔහු මුහාජිර් කෑම්ප් බාබුල් මදීනාකරාච්චි වල පදිංචි වී සිටියේය. ඔහුගේ අවසන් ඉල්ලීම පරිදි කfපන් කිරීමෙන් පසු ඔහුගේ හිසමත කොළ පාට ඉමාමා ෂරීfපයන් සරසා තබන ලදි. මුහාජිර් කෑම්ප් 7 කබ්රිස්ථානයේ භූමිදානය කරනු ලැබීය. බ්‍රහස්පතින්දා රෑ (රබියුල් ආහිර් (රබියුල් ගවුස්) 1422හි) එනම් 2001 වර්ෂයේ ජූලි මාසයෙ 12 වැනිදා මර්හූම් නවීද් අත්තාරී අලයිහි රහ්මතුල්ලා හිල්බාරී තම සහෝදරයා වෙත සිහිනෙන් පැමිණි මාගේ කබ්රයට පැමිණෙන්නේ නැද්ද? ටිකක් ඇවිත් බලන්න කුමක් ද වෙලා තිබෙන්නේ

කියා පැවසුවේය. එම රාත්‍රියේ තද වැස්සක් ද පැවතුණි. පසුව කබ්රිස්ථානය (සොහොන් භූමියට) පැමිණ බැලූ විට කබ්රය ගිලා බැස තිබුණි. ඉරිදා දිනයේ පෙ.ව 7.30 පමණ මර්හූම්ගේ සහෝදරයන් සමඟ දෑවතේ ඉස්ලාමීයේ හාෆිල් වරුන් අටදෙනකු කබ්රය වෙත පැමිණීමෙන් පසු තවත් පිරිසක් ඉදිරියේ කබ්රය හෑරීමට (ජනාසාව පිටතට ගෙන නැවත නිසියාකාරව තැබීමට) ආරම්භ කළහ. ඒ සමඟ මර්හූම් නවීද් අත්තාරීගේ දේහය තැබූ ආකාරයට ම හිසමත කොළපාට තලප්පාව සමඟ සලාතයට සිටින ආකාරයෙන් දෑත් බැඳ කෆ්පන් ද කිසිම විනාශ වීමකින් තොරව නියමාකාරයෙන් තිබෙනු දැක සියලු දෙනාම සිතා ගත නොහැකිව මවිතටය පත් වී සිටියහ. ඉස්ලාමීය සහෝදරයන් සතර දෙනෙකු බැස එම දේහය පිටතට ගත්හ. එහි සුවඳ සෑම දිශාවකටම පැතිරෙන්නට විය. කබ්රය සකස් කිරීමෙන් පසු නැවත දේහය තබා වසන ලදි. අල්ලාහ් ත අලා නවීද් අත්තාරිට කරුණා කරත්වා එතුමාගේ පිටිටෙන් අපට සමාව දෙත්වා! ආමීන් බිජාහින් නබීයිල් අමීන් صلى الله تعالى عليه وآله وسلم

## මෙය අලුත් සිදු වීමක් නොවේ

අල්හම්දුලිල්ලාහ් අලා ඉහ්සානිහී කුර්ආනය හා සුන්නතය ප්‍රචාරය කරන දේශපානයෙන් තොර ලෝක සංවිධානය වන දෑවතේ ඉස්ලාමී සත්‍ය වන්තයන්ගේ සුන්නතයන් වලින් පිරුණු සංවිධානයක්, දෑවතේ ඉස්ලාමීවරුන්ට අල්ලාහ් ත ආලාගේ හා රසුල් තුමාණන්ගේ විශේෂ කරුණා දයාව ලැබෙන්නේය. මෙම සිද්ධිය අපහට අලුත් දෙයක් නොවන්නේය. මෙසේ ඊමානය ස්ථිරත්වය පත් කරන සිද්ධීන් කළිනුත් කිහිප වතාවක්ම සිදු වී ඇත.

ඔබ සැම “දෑවතේ ඉස්ලාමී කී බහාරේන්” නැමැති පොතෙහි පළමු හා දෙවන කොටස කියවූ විට ඔබ පුදුමයට පත් විය හැක. ඉන්ෂා අල්ලාහ් තආලා

හිතාදර ඉස්ලාමීය සහෝදරවරුණි! දෙවියන්ගේ නාමයෙන් දිවුරා කියමි. දෑවතේ ඉස්ලාමියේ මදනි මාහෝල් (වට පිටාව, පරිසරය) අත් නොහරින්න. ෂෛතාන් ඔබට නොයෙකුත් ආකාරයෙන් සැකයන් ඇති කරත් ඔබ එය පැත්තකට කර දෑවත් ඉස්ලාමීය සමඟ රැඳී සිටින්න. මර්කසී මජ්ලියේ ෂුරාවට අවනත වී මදනි වැඩ කරගෙන සිටින්න. මදනි කාfපිලා වල සfපර් (ගමන්) කරන්න. මදනි ඉනාමත් කාඩ් පුරවා අදාළ බලධාරියාට බාර දෙන්න. ඉන්ෂා අල්ලාහ් ත ආලා ඔබට කියාමත් දිනයේ පරීක්ෂණයෙන් සමත් වීමට පහසු වනවා ඇත. තවද දෙලොවෙහිම ජය ලබා ගත හැකිය.

## සවාබුල් ජාරියා (සදකතුල්ජාරියා)
## (දිගටම ලැබෙන කුසල්)

**මෙම පොත් පිංච කියවීමෙන් පසු අනුන්ටත් දී උදව් වෙන්න. තවද මීලාද් උත්සව වලත්, අව්ලියාවරුන්ගේ දානයන් (කන්දූරි) වලත්, මංගලයය උත්සව වලදීත්, කතමුල් කුර්ආන් තමාම් කරන අවස්ථාවලත්, තවද ආගමික උත්සව වලදීදීත්, මළවුන්ට පින් ලබාදීම පිණිසත්, තවද අමාරු දුෂ්කර අවස්ථාවලින් මිදීමත් මෙම පොත මක්තබතුල් මදීනාවෙන් මිළදීගෙන අධික ලෙස පින් (කුසල්) ලබා ගන්න.**

මෙම පොත භාෂා ගණනාවකින් **www.dawateislami.net** වෙබ් අඩවියේ පළ කර ඇති අතර අවශ්‍ය භාෂාවකින් කියවීමට ඒ වෙත යොමුවන්න.

٧٨٦
قفل مدينـــــه
٩٢

الصلوة والسلام عليك يارسول الله

# සුන්නතයන් හි වසන්තයන්

අල්හම්දුලිල්ලාහ් عَزَّوَجَلَّ අල්කුර්ආනය හා සුන්නතයන් උගන්වන අහ්ලුස් සුන්නත්වල් ජමාඅතයේ දේශපාලනයෙන් තොර ලෝක සංවිධානයක් වන දඃවතේ ඉස්ලාමියේ සුවඳවත් මදනි වට පිටාව තුල වැඩි වශයෙන් සුන්නතයන් **ඉගෙනීමත්** ඉගැන්වීමත් සිදු කරනු ලැබේ. සෑම බ්‍රහස්පතින්දා සවස මඃරිබ් සලාතයේ සිට නො. 10 මැසෙන්ජර් වීදියේ කොළඹ 12 යන ලිපිනයේ සිදු වන සුන්නත් වලින් පිරුණු ඉජ්තිමාවේ ආරම්භයේ සිට අවසානය දක්වා සහභාගි වි වැඩි වැඩියෙන් පින් (කුසල්) රැස්කර ගන්න.

තවද රසුල් صَلَّى اللّٰهُ تَعَالٰى عَلَيْهِ وَاٰلِهٖ وَسَلَّم තුමානන් ගේ ස්නේහවන්තයන් සමග **සුන්නතයන්** ඉගෙන ගැනීමට මදනි කාෆිලාවල ගමන් කරන්න. ඔබ ශීලාචාර මුස්ලිම්වරු (හොඳ පුරවැසියන්) වීමට මක්තබතුල් මදීනා එනම් දඃවතේ ඉස්ලාමි පොත් හලකින් මදනි ඉන් ආ මාත් කාඩ් පතක් සෑම ඉස්ලාමි මාස ආරම්භයේදීම ලබාගෙන එහි ඇති පරිදි ක්‍රියා කර (අමල් කර) දිනපතා ෆික්රේ මදීනා (තම ක්‍රියාවන් අධීක්ෂණ) කරමින් එය පුරවා සෑම ඉස්ලාමීය මාසයේ අවසානයේදී ඔබේ ප්‍රදේශයේ දඃවතේ ඉස්ලාමි බලධාරියාට එය භාර දෙන්න. ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ මෙහි බරකතයෙන් ෆර්ල් වාජිබ් හා සුන්නතයන් නිසියාකාරව පිළිපැදීමටත් පාප ක්‍රියාවන් වලින් ඈත් වී ඊමානය ආරක්ෂා කර ස්ථිර තත්වයකට පැමිනීමක් දැකිය හැක.

සෑම ඉස්ලාමීය සහෝදරවරුන් තම තමාවත් සියලු ලෝවැසියන් යහමගට ගැනීමට උත්සාහ දරමි (කරමි) ඉන්ෂා අල්ලාහ් عَزَّوَجَلَّ යන මදනි (යහ) අරමුණ (මතය) තම අරමුණ කර ගත යුතුයි. තමන් ශිලාචාර (යහමගට පැමිනීම) වීමට මදනි ඉන්ආමාත් අනුව ක්‍රියා (අමල්) කරන අතර ලෝ වැසියන් (ලෝකයේ ජනතාව) ශිලාචාර කිරීමට මදනි කාෆිලාවේ ගමන් කිරීමෙන් ඉහත සඳහන් මදනී අරමුණ ඉටුකර ගත හැකිය.